සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
තෙවන වාර පරීක්ෂණය 2018

9 ශ්‍රේණිය **බුද්ධ ධර්මය** **කාලය පැය 02 යි**

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි

- **පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු දෙක බැගින් හිමිවේ.**
- **දෙවන කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

I - කොටස

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01 බුද්ධ චරිතය තුළින් ප්‍රකට කෙරෙන නායකත්ව ලක්ෂණ සමුදාය අතරින් එකක් නොවන්නේ,

(1) ආදර්ශවත් බව (2) බලයට ආශාව (3) සමානාත්මතාවය (4) කාරුණික බව

02 බුදුරදුන්ගේ දකුණු අකු ධාතුව නිදන් කොට තනන ලද ස්තූපය වන්නේ,

(1) මුතියංගණය (2) මිරිසවැටිය (3) ජේතවනය (4) ථූපාරාමය

03 තෘෂ්ණාව සපුරා නැති කිරීම

(1) සීලයයි. (2) නිවනයි. (3) මධ්‍යම ප්‍රතිපදාවයි. (4) චතුරාර්ය සත්‍යයයි.

04 දස කුසලයට අයත් නොවේ,

(1) අර්ථවත් වචන ප්‍රකාශය (2) බොරු කීම
(3) පරපණ නැසීම (4) තරහව

05 දානං සීලං පරිච්චාගං .... මෙයින් දැක්වනුයේ,

(1) දස පාරමිතාය (2) දස කුසල්ය (3) දස රාජ ධර්මය (4) දස අකුසල්ය

- **අංක 06 - 10 දක්වා ප්‍රශ්නවලට 'අ' කොටසේ ප්‍රකාශවලට ගැළපෙන ප්‍රකාශය 'ආ' කොටසින් තෝරා එහි අක්ෂරය වරහන් තුළ යොදන්න.**

	'අ'		'ආ'
06	දෙවන ධර්ම සංගායනාව	A	ථූපවංශය
07	පොළොන්නරු යුගයට අයත් චිත්‍ර	B	ගොවිතැන
08	කුරුණෑගල යුගය	C	ශ්‍රද්ධාව
09	ධාර්මික ධනෝපායණ මාර්ගයකි	D	දස අකැප වස්තුව
10	ඉන්ද්‍රිය ධර්මයකි.	E	ලංකාතිලක විහාරය

- **අංක 11 - 15 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු හිස්තැන මත ලියන්න.**

11 බුදුරදුන් අවසාන වස් කාලය ගත කළේ .... ය.

12 ශරීරයේ ක්‍රියාකාරීත්වය හා ස්වභාවය පිළිබඳ සිහිය පවත්වා ගැනීම .... යි.

13 උපතිස්ස පිරිවැජියාට 'යේ ධම්මා හේතුප්පභවා' ගාථාව දේශනා කළේ .... හිමියන්ය.

14 .... වෙනුවට බුදු දහම ආදේශ කරන්නේ දානයයි.

15 නිරෝගීකම උතුම්ම .... යි.

- **අංක 16 - 20 දක්වා ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

16 මහා සඟරුවන මනා පිළිවෙත් ඇති බැවින් සුපටිපන්න නම් වේ. (   )

17 අටලෝ දහමින් කම්පා නොවීම මංගල කරුණකි. (   )

18 තෙවන ධර්ම සංගායනාවට මූලිකත්වය ගත්තේ මහා කාශ්‍යප තෙරුන්ය. (   )

19 සත්තුභත්ත ජාතකය ඇසුරින් කාව්‍යශේඛර රචිතය. (   )

20 ගොවිතැන දැහැමි ධනෝපායන මාර්ගයක් නොවේ. (   )

(ලකුණු 2 x 20 = 40)

II කොටස

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, 02 සිට 07 දක්වා ප්‍රශ්නවලට ලකුණු 10 බැගින් ද හිමිවේ.**

01 කෙටි පිළිතුරු සපයන්න.

(i) අටමස්ථාන අතරින් 02 ක් නම් කරන්න.

(ii) ප්‍රජාපතී ගෝතමියගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ 02 ක් ලියන්න.

(iii) ශීලයෙහි පදනම වන්නේ කුමක් ද?

(iv) නිවැරදි වචනයේ ආකාර 02 දක්වන්න.

(v) හේතුඵල දහම හඳුන්වන තවත් නමක් ලියන්න.

(vi) දස අකැප වස්තුවෙන් 02 ක් නම් කරන්න.

(vii) අනුරාධපුර යුගයට අයත් සාහිත්‍ය ග්‍රන්ථ 02 ක් ලියන්න.

(viii) මහිච්ඡතාව යනු කුමක් ද?

(ix) දස රාජ ධර්ම 02 ක් නම් කරන්න.

(x) ශ්‍රද්ධාවේ මූලික ප්‍රභේද 02 ක නම් කරන්න. (ලකුණු 2 x 10 = 20)

02 (i) සොළොස්මස්ථාන අයත් ස්ථාන 02 ක් ලියන්න. (ලකුණු 02)

(ii) ඉහත දැක්වූ එක් ස්ථානයක් පිළිබඳව පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iii) අර්ථාන්විත වන්දනයේ ප්‍රයෝජන පෙන්වා දෙන්න. (ලකුණු 05)

03 (i) තණ්හාවේ ප්‍රභේද 03 ලියන්න. (ලකුණු 02)

(ii) 'නිබ්බාණං පරමං සුඛං' මෙය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iii) සරල ජීවිතයකට හුරු වීම ශිෂ්‍ය ජීවිතයට ප්‍රයෝජනවත් වන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 05)

04 (i) දස අකුසල් වලින් 05 ක් නම් කරන්න. (ලකුණු 02)

(ii) 'චේතනාහං භික්ඛවේ කම්මං වදාමි' මෙහි තේරුම ලියන්න. (ලකුණු 03)

(iii) කර්ම විපාක දැන සිටීමේ යහපත් ප්‍රතිඵල මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

05 (i) ධම්ම පදය අයත් නිකාය හා පිටකය නම් කරන්න. (ලකුණු 02)

(ii) 'සබ්බේ තසන්ති දණ්ඩස්ස ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 03)

(iii) ලොව සෑම සත්වයෙකුට ම ජීවත් වීමේ අයිතිය ඇති බව බුදු දහමේ දක්වා ඇත. නිදසුන් සහිතව දක්වන්න. (ලකුණු 05)

06 (i) දෙවන ධර්ම සංගායනාවට හේතු වූ කරුණු දක්වන්න. (ලකුණු 02)

(ii) දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල 03 ක් ලියන්න. (ලකුණු 03)

(iii) ශාසනයේ චිර පැවැත්මට හා ව්‍යාප්තියට ධර්ම සංගායනා තුළින් ලද පිටිවහල පැහැදිලි කරන්න. (ලකුණු 05)

07 පහත සඳහන් මාතෘකා අතරින් 2 ක් තෝරා කෙටි සටහන් ලියන්න.

(i) සීලය

(ii) හේතුඵල දහම

(iii) දස රාජ ධර්ම

(iv) ශ්‍රද්ධාව (ලකුණු 5 x 2 = 10)